අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 87 | S | I |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தரப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I,II
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I,II
**Communication and Media Studies I,II**

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் 10 -நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.


## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

**සැලකිය යුතුයි:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

1. සන්නිවේදනය පිළිබඳ තාක්ෂණික පදනමකින් යෙබ් ආකෘතියක් නිර්මාණය කිරීමට දායක වූයේ,
   (1) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය. (2) එඩ්වඩ් හාපර් ය.
   (3) ක්ලෝඩ් ෂැනොන් ය. (4) විල්බර් ශ්‍රාම් ය.

2. පහත රූපසටහන සන්නිවේදන ආකෘතියකට සමාන වේ නම්, එහි E විය හැකි වන්නේ,




   (1) බලපෑම යි. (2) අග්‍රස්ථානය යි.
   (3) සන්නිවේදකයා යි. (4) ග්‍රාහකයා යි.

3. B විසින් E වෙත සන්දේශයක් සම්ප්‍රේෂණය කරන අවස්ථාව හඳුන්වන්නේ,
   (1) ප්‍රතිග්‍රහණයක් ලෙසිනි. (2) දොරටුපාලක ක්‍රියාවලිය ලෙසිනි.
   (3) වාරණයක් ලෙසිනි. (4) ප්‍රතිපෝෂණයක් ලෙසිනි.

4. අවාචික සන්නිවේදනයේ දී පෞද්ගලික අවකාශයේ සිටිය හැකි වන්නේ,
   (1) යහළුවන් (2) ගනුදෙනුකරුවන්
   (3) සාමාන්‍ය ජනයා (4) බස් නැවතුමේ හමුවන පුද්ගලයින්

5. සනුකි සිය පියාගේ නිල මුද්‍රාවෙන් හිස් කොළයක සීල් තබමින් සිටිනු දුටු පියා එය "බොහෝම වැදගත් උපකරණයක්" යැයි පැවසී ය. ඒ අනුව එහි වැදගත්කමක් විය හැකි වන්නේ,

(1) නිලධාරියාගේ අත්සනට අලංකාරයක් ලැබීම
(2) යම් ලේඛනයක් ආයතනයට ලැබුණු බව තහවුරු කිරීම
(3) යම් ලේඛනයක සුරක්ෂිතතාව තහවුරු කිරීම
(4) නිලධාරියාගේ අනුමැතිය ලද බව තහවුරු කිරීම

6. අවාචික සන්නිවේදනයේ ලක්ෂණයක් **නොවන්නේ,**

(1) අඛණ්ඩ ක්‍රියාවලියක් වීම (2) පුද්ගලබද්ධතාවෙන් තොර වීම
(3) කාය භාෂාව හා පාර භාෂාව භාවිත කිරීම (4) අචේතනිකව සිදු වීම

7. ලොව ප්‍රථම මුද්‍රිත ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ,

(1) ලතින් ව්‍යාකරණය යි. (2) බයිබලය යි.
(3) ලන්ඩන් ගැසට් ය. (4) වජ්‍ර සූත්‍රය යි.

8. ජනමාධ්‍යයේ සැබෑ වගකීමක් **නොවන්නේ,**

(1) ජනමාධ්‍ය වැඩසටහන් තුළින් ගැටුම් අවුළුවාලීම ය.
(2) සදාචාරය හා සාරධර්ම සුරකින සමාජයක් ගොඩනැගීම ය.
(3) තම ග්‍රාහකයින්ට උසස් විනෝදාස්වාදයක් අත්කර දීම ය.
(4) මානව ධර්මතා සමාජගත වන පරිදි සන්දේශ නිර්මාණය කිරීම ය.

9. ගුවන්විදුලි නාට්‍යයකට සවන් දීමේ දී නාට්‍යයේ සිදුවීම් පිළිබඳ රූප මනසේ මැවීම,

(1) ස්ව සංකල්පය යි. (2) පරිකල්පනය යි.
(3) ද්විරූපතාව යි. (4) සංජානනය යි.

10. ජංගම දුරකථනය හා සම්බන්ධ විද්‍යුත් මාධ්‍ය ක්‍රියාවලියක් වන්නේ,

(1) විද්‍යුත් තැපැල පරීක්ෂා කිරීම යි. (2) ඡායාරූප ලබා ගැනීම යි.
(3) දුරකථන ඇමතුම් ගැනීම යි. (4) ගුවන්විදුලි සේවා ශ්‍රවණය කිරීම යි.

11. පුද්ගල පංචේන්ද්‍රිය මගින් ලැබෙන විවිධ සන්දේශ ග්‍රහණය කර ගෙන එය තේරුම් ගැනීමේ ක්‍රියාවලිය,

(1) සන්නිවේදනය යි. (2) සංජානනය යි.
(3) සංවේදනය යි. (4) සහවේදනය යි.

12. DTP ක්‍රියාවලිය හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ.

A. නිමි පිටපතේ අපේක්ෂිත ප්‍රමිතීන්
B. යොදා ගන්නා කඩදාසියේ දිග පළල
C. මුද්‍රණය වන කොටසේ දිග පළල
D. පිටු අංක කිරීම
E. පටුන සම්පාදනය
F. මුල් පිටු හා අවසාන පිටු සැකසීම

මෙම කරුණු වඩාත් වැදගත් වන්නේ,

(1) අත්පිටපත සැකසීම සඳහා ය. (2) අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීම සඳහා ය.

(3) මුද්‍රණය හා පිටපත්කරණය සඳහා ය. (4) නිමි කටයුතු සඳහා ය.

13. පෙර ගෙවුම් සහිත දුරකථනයක් භාවිත කරන සුරම්‍යා කිසි දිනෙක සන්නිවේදන මධ්‍යස්ථානයකට තම අංකය ලබා නොදී, කාඩ්පතක් මගින් පෙර ගෙවුම් කරයි. ඉන් ඇයට ඇති වාසියක් වීමට අවම ඉඩක් ඇත්තේ,

(1) තම දුරකථන අංකය අන් සතු වීමෙන් වැළකීම

(2) දුරකථනය තමන්ගේ පෞද්ගලික ජීවිතයට බාධාවක් වීමෙන් වැළකීම

(3) තමන් නොදන්නා අතහැරුණු ඇමතුම්වලට (Missed calls) ඇමතීමෙන් වැළකීම

(4) නොදන්නා පිරිස් වෙතින් සිය දුරකථනයට අනවශ්‍ය පණිවිඩ පැමිණීමෙන් වැළකීම

14. විද්‍යුත් තැපැල පිළිබඳ සේමිණි ලියාගෙන ඇති කරුණු අතරින් ගුරුතුමියට සංශෝධනය කළ හැකි කරුණක් වන්නේ,

(1) යාහූ (Yahoo) හා ගූගල් (Google) වැනි අන්තර්ජාල සේවා e-mail පහසුකම නොමිලේ ලබා දෙයි.

(2) මුදල් ගෙවා නිල වශයෙන් විද්‍යුත් ලිපිනයක් ලබා ගත හැකි ය.

(3) පුද්ගල හෝ කාර්යාලයක නමින් හෝ විද්‍යුත් ලිපිනයක් ලබා ගත හැකි ය.

(4) ආයතනික විද්‍යුත් ලිපිනයක් යටතේ එහි කාර්ය මණ්ඩලයට ද වෙන් වෙන් ව විද්‍යුත් ලිපින ලබා දිය නොහැකි ය.

15. මානව සන්නිවේදනය පිළිබඳ කියැවෙන පහත ප්‍රකාශවලින් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) සන්නිවේදනය මානවයාට පොදු අත්‍යවශ්‍ය උවමනාවකි.

(2) සන්නිවේදන ක්‍රියාකාරකම් දියුණු වූයේ සමාජ අවශ්‍යතාවක් ලෙසිනි.

(3) අත්දැකීම ප්‍රකාශ කිරීමට ගත් උත්සාහයක් ලෙස අතීත සන්නිවේදන ක්‍රම බිහි විය.

(4) අතීත මානවයා සන්නිවේදනය සඳහා ම විවිධ නව සොයා ගැනීම් කළහ.

16. සුදු ලැල්ලේ සටහන් කළ පෙර පාඩමේ තොරතුරු සම්පූර්ණයෙන් ම මකා නොතිබූ බැවින් අලුත් පාඩමට අදාළව ප්‍රක්ෂේපණය කරන ලද රූපසටහන පැහැදිලි බවින් තොර විය. මෙය

(1) අර්ථ බාධකයකි. (2) මාධ්‍ය බාධකයකි.

(3) විද්‍යුත් බාධකයකි. (4) දෘශ්‍ය බාධකයකි.

17. තොරතුරු වාර්තාකරණය හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ.

A. ඉදිරිපත් කරන කරුණු නිවැරදි ලෙස ග්‍රහණය කර ගත හැකි භාෂා රටාවක් යොදා ගැනීම

B. වාර්තා කරන තොරතුරු පැහැදිලි විය යුතු වීම

C. සංකීර්ණ වාක්‍ය රටා, වැරදි උච්චාරණ අවම වීම

D. අපැහැදිලි රූපමය දර්ශනවලින් තොර වීම

මෙම සියලු කරුණු මගින් අවධාරණය කෙරෙන්නේ,

(1) නිවැරදි බව (2) සමතුලිත බව

(3) පැහැදිලි බව (4) විශ්වසනීයත්වය

18. ශ්‍රී ලංකාවේ පළ වන පොතකට ISBN හා සුචිකරණ දත්ත ලබා දෙනුයේ,
    (1) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසිනි.
    (2) මහජන පුස්තකාලයේ සුචිකරණ අංශය විසිනි.
    (3) ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලයෙනි.
    (4) රජයේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙනි.

19. ශ්‍රී ලංකාවේ පළමු සිංහල සඟරාව වූ 'මාසික තෑග්ග' ආරම්භ කළේ,
    (1) දේශපාලනමය කරුණුවලින් ජනතාව දැනුවත් කිරීමේ පරමාර්ථයෙනි.
    (2) ලංකාවේ එවකට පැවති ආගම් ඇගයීමේ පරමාර්ථයෙනි.
    (3) ක්‍රිස්තියානි ආගම ඇගයීමේ පරමාර්ථයෙනි.
    (4) ජාතික නිදහස ලබා ගැනීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ පරමාර්ථයෙනි.

20. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
    (1) වාචික සන්නිවේදනය කථනය මගින් සිදු කළ නොහැකි ය.
    (2) නිර්වාචික සන්නිවේදනය සඳහා හඬ භාවිත කළ හැකි ය.
    (3) ලිඛිත සන්නිවේදනය මාධ්‍ය අනුව වෙනස් විය හැකි ය.
    (4) කථන සන්නිවේදනය විධිමත් විය හැකි ය.

21. සන්නිවේදකයා තම සන්දේශය තෝරාගත් කිහිපදෙනෙකුටත් ඔවුන් ද තෝරාගත් කිහිපදෙනෙකුටත් සන්දේශය ලබාදෙන අවිධිමත් සන්නිවේදන ආකෘතිය වන්නේ,
    (1) පර්ෂද දාමය යි. (2) තනි දාමය යි.
    (3) ඔපාදූප දාමය යි. (4) සම්භාවිතා දාමය යි.

22. එක්තරා පුවත්පතක් පොදු අතිරේකයට අමතර ව ඒ ඒ ප්‍රදේශවලට අදාළ පුවත් පමණක් ඇතුළත් කලාපීය අතිරේක ද එක් කරමින් වෙන් වෙන් වශයෙන් මුද්‍රණය කර බෙදා හරියි. එසේ සිදු කිරීමේ ප්‍රවෘත්තිමය වටිනාකම වන්නේ,
    (1) අදාළ බව යි. (Relevance) (2) කැපීපෙනීම යි. (Prominence)
    (3) සමීප බව යි. (Proximity) (4) මානව ළැදියාව යි. (Human Interest)

23. රූපවාහිනී මාධ්‍යයේ ලක්ෂණයක් වන්නේ,
    (1) අස්ථායි මාධ්‍යක් නොවීම (2) සජීවී මාධ්‍යයක් වීම
    (3) ජනමාධ්‍යක් නොවීම (4) සුළු ආයෝජනයකින් මාධ්‍ය ක්‍රියාකාරීව ඇරඹීමට හැකි වීම

24. ගුවන්විදුලි නාට්‍ය පිටපත් රචනයේ දී වඩාත් සැලකිලිමත් විය යුත්තේ,
    (1) ගැඹුරු සංකීර්ණ අදහස් ග්‍රාහකගත කිරීමට ය.
    (2) පරිකල්පනීය භාෂාවකින් පිටපත් රචනයට ය.
    (3) සංඛ්‍යා ලේඛන සහිත විස්තරාත්මක පිටපත් රචනයට ය.
    (4) තාක්ෂණික බස්වහරින් පිටපත් රචනයට ය.

25. බහුල වශයෙන් යොදා ගන්නා වාර්තාකරණ ක්‍රම දෙකකි,

(1) ඍජු වාර්තාකරණය හා නිර්මාණාත්මක වාර්තාකරණය

(2) ප්‍රවෘත්ති වාර්තාකරණය හා දැන්වීම් වාර්තාකරණය

(3) ඍජු වාර්තාකරණය හා ප්‍රවෘත්ති වාර්තාකරණය

(4) ප්‍රවෘත්ති වාර්තාකරණය හා නිර්මාණාත්මක වාර්තාකරණය

26. සංවෘත පරිපථ රූපවාහිනී කැමරා පද්ධතියක් මගින් ලබා ගත හැකි සේවාවකි.

(1) ආයතනයේ කටයුතු නිවසේ සිට ම මෙහෙයවා ගත හැකි වීම

(2) ආයතනයේ සේවකයන් පාලනය සඳහා භාවිත කළ හැකි වීම

(3) ආයතන පරිශ්‍රය තුළ ආරක්ෂිත බව තහවුරු කරගත හැකි වීම

(4) ආයතනයට පැමිණෙන පුද්ගලයන්ගේ දර්ශන පසුව වුව ද බලාගත හැකි වීම

27. නිශ්චල ඡායාරූප භාවිතයෙන් මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසියක් **නොවන්නේ**,

(1) අදහස් ප්‍රබල ව ඉදිරිපත් කළ හැකි වීම

(2) පහසුවෙන් ග්‍රාහක ආකර්ෂණය ලබා ගත නොහැකි වීම

(3) ඕනෑම අයෙකුට පහසුවෙන් තේරුම් ගත හැකි වීම

(4) මුද්‍රණ තාක්ෂණය සමඟ පහසුවෙන් අනුගත විය හැකි වීම

28. අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා පමණක් භාවිත කළ හැකි තාක්ෂණික මෙවලම් අඩංගු පිළිතුර තෝරන්න.

(1) තැපැල් ලිපි, විද්‍යුත් තැපෑල, යූ ටියුබ්

(2) ජංගම දුරකථන, යූ ටියුබ්, තැපැල් ලිපි

(3) අන්තර්ජාල දුරකථනය, යූ ටියුබ්, විද්‍යුත් තැපෑල

(4) ජංගම දුරකථනය, විද්‍යුත් තැපෑල, තැපැල් ලිපි

29. මාධ්‍ය, කර්මාන්තයක් ලෙස වර්ධනය වීමේ දී මාධ්‍ය නිර්මාණවල කර්තෘ අයිතිය සුරැකීමට ''රැජිනගේ ව්‍යවස්ථාව'' (Queen Ann's Statute) බිහි විය. එය,

(1) බුද්ධිමය දේපල සුරැකීමට මෑත කාලීනව නිර්මාණය වූවකි.

(2) 2003 අංක 36 දරණ ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපල පනත හඳුන්වන අන්වර්ථ නාමයකි.

(3) 1910 අප්‍රේල් 10 වන දින සම්මත වූ ලොව ප්‍රථම ප්‍රකාශන හිමිකම් නීතිය යි.

(4) ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේ ආචාර ධර්ම මාලාව හඳුන්වන නාමය යි.

30. ශ්‍රී ලංකාවේ ප්‍රථම රූපවාහිනී නාලිකාව හා එය ආරම්භ කළ වර්ෂය දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) 1979 ස්වාධීන රූපවාහිනී සේවය

(2) 1982 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

(3) 1982 ස්වාධීන රූපවාහිනී සේවය

(4) 1979 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

31. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස පිළිබඳ දැක්වෙන වගන්තිය වන්නේ,

(1) 14 1 (අ) වගන්තිය යි. (2) 19 වගන්තිය යි. (3) 15 i වගන්තිය යි. (4) 15 ii වගන්තිය යි.

32. රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදයක් ඇතුළත් **නොවන** වරණය වන්නේ,

(1) ප්‍රවෘත්ති, වාර්තා වැඩසටහන්, ටෙලි නාට්‍ය

(2) සංගීත වැඩසටහන්, සම්මුඛ සාකච්ඡා, සංවාද

(3) ටෙලිනාට්‍ය, සඟරාමය, යථාකාරී වැඩසටහන්

(4) නාට්‍ය, වෙළෙඳ දැන්වීම්, කිංකිණි නිවේදන

❖ **පහත දැක්වෙන ජංගම දුරකථන හා පරිගණක ආචාර ධර්ම ඇසුරින් 33 - 34 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. අන් අය කාර්ය බහුල, නිදන හෝ විවේක ගන්නා අවස්ථා වැනි අවස්ථාවල දී ඔවුන්ට කරදරකාරී නොවන ලෙස භාවිත කිරීම

B. තමාට පරිබාහිර ජාලයන්ට අනවසරයෙන් ඇතුළු වීමෙන් වැළකීම

C. ඇමතුම ලබා දෙන්නා හෝ ලබා ගන්නා වෙත ආචාරශීලී ලෙස කතා කිරීම

D. සිනමා ශාලා, පුස්තකාල, රැස්වීම් වැනි පොදු ස්ථානවල දී භාවිතයෙන් වැළකීම හෝ ක්‍රියා විරහිත කර හෝ නිශ්ශබ්ද කර තැබීම

E. අන් අයගේ පරිගණකගත දත්ත, ලිපි ගොනු ආදිය පරිහරණ කිරීමෙන් වැළකීම

F. e mail ඔස්සේ පැමිණෙන නාඳුනන පණිවිඩවලට අනවශ්‍ය පරිදි ප්‍රතිචාර දැක්වීමෙන් වැළකීම

33. මේ අතරින් ජංගම දුරකථන ආචාර ධර්මවලට අයත් වනුයේ,

(1) A,B හා E ය. (2) A,B,C හා F ය.

(3) A,B,C,D හා E ය. (4) A,B,C,D හා F ය.

34. ඉහත කරුණුවලින් පරිගණක භාවිතය හා සම්බන්ධ ආචාර ධර්මවලට අයත් වනුයේ,

(1) A,C හා E ය (2) A,B,C හා F ය

(3) A,B,E හා F ය (4) A,B,C,D,E හා F ය

35. ප්‍රකාශන නිදහසේ අගය ලොවට පහදා දෙමින්, මෙතෙක් ප්‍රකාශයට පත්ව ඇති මූලික මානව අයිතිවාසිකම් පිළිබඳ උසස්ම ලියවිල්ල වන්නේ,

(1) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යි. (2) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය යි.

(3) බුද්ධිමය දේපළ පනත යි. (4) නිදහස් මාධ්‍ය සංසදයේ ආචාර ධර්ම මාලාව යි.

36. විචාරශීලී ග්‍රාහකත්වය සතු විය යුතු නිපුණතාවක් **නොවන්නේ,**

(1) මාධ්‍ය මගින් ග්‍රාහකගත වන සන්දේශ විශ්ලේෂණය කිරීම

(2) මාධ්‍ය විසින් ලබා දෙන ප්‍රවෘත්ති වගකීමෙන් යුතුව පරිහරණය කිරීම

(3) මාධ්‍ය විසින් ලබා දෙන සියලුම තොරතුරු නිවැරදි ලෙස පිළිගැනීම

(4) සමාජයට හානි නොවන අයුරින් මාධ්‍ය පරිහරණය කිරීම

37. පහත කරුණු අතරින් විද්‍යුත් පුවත්පතක පොදු ලක්ෂණ පමණක් අඩංගු වරණය කුමක් ද?

A යාවත්කාලීන කිරීමේ හැකියාව

B ගබඩා කර තබා ගැනීමේ පහසුව

C ක්ෂණිකව පුවත් දැනගැනීමේ හැකියාව

D වර්ණවත් පින්තූර හා අකුරු පමණක් යොදාගැනීම

(1) A,B පමණි (2) C,B පමණි

(3) A,B,C පමණි (4) A,B,C,D සියල්ල ම

38. අඩුකාල පරතරයක් සහිත ව රූප පෙළක් චලනය වන විට රූප අතර පරතරය මිනිස් ඇසට හසු නොවීම පිළිබඳ පැහැදිලි කළ හැකි සිද්ධාන්තය කුමක් ද?

(1) රූප සංරචනය (2) ස්වර්ණමය රීතිය

(3) ක්ෂේත්‍ර ගැඹුර (4) දෘෂ්ටියේ අඛණ්ඩතාව

39. පවතින ආර්ථික අර්බුදය ජය ගැනීමට ශ්‍රී ලංකාවේ දේශීය වෙළෙඳපොළ වර්ධනය උදෙසා ජනමාධ්‍යයට ඇති ප්‍රමුඛ වගකීමක් **නොවන්නේ,**

(1) ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනය කරවීම යි.

(2) දේශීය නිෂ්පාදන කෙරෙහි ජන කැමැත්ත වැඩි කිරීම යි.

(3) දේශීය වෙළෙඳපොළ ප්‍රවර්ධනය කරන මාධ්‍ය සන්දේශ නිර්මාණය යි.

(4) ප්‍රවෘත්ති විශේෂාංග සහ විවිධ විශේෂ වැඩසටහන් මගින් දේශීය නිෂ්පාදන හා සේවා පරිභෝජනයට පෙළඹවීම යි.

40. මෑත කාලයේ බිහි වූ පෙරළිකාර තාක්ෂණය වන අංකිත තාක්ෂණය පදනම් කරගෙන නව මාධ්‍ය බිහි විය. නව මාධ්‍යයේ ස්වභාවය වන්නේ,

A ග්‍රාහකයා අභිමත පරිදි සංදේශ තෝරා ගත හැකි වීම

B භූගෝලීය වශයෙන් සීමා නැති වීම

C ඕනෑම අවස්ථාවක ඕනෑම ස්ථානයක සිට භාවිත කළ හැකි වීම

D ගෝලීය වශයෙන් ව්‍යාප්තිය සිදුවීම

(1) A,B,C නිවැරදි ය. (2) D පමණක් වැරදි ය.

(3) A,B,C,D සියල්ල නිවැරදි ය. (4) A,B,C,D සියල්ල වැරදි ය.

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

87 | S | II

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I,II**
**தொடர்பாடலும் ஊடகக் கல்வியும் I,II**
**Communication and Media Studies I,II**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II**

* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක් ද** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.

1. පාසල් මාධ්‍ය සමාජය මගින් සංවිධානය කරන ක්ෂේත්‍ර චාරිකාවේ දී ජනමාධ්‍ය ආයතනයක අභ්‍යන්තර ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමට යෝජනා කරගන්නා ලදී.

(i) මාධ්‍ය ආයතන නැරඹීම සඳහා අවසර ලබා ගැනීමට භාවිත කළ හැකි ලිඛිත සන්නිවේදන ක්‍රමයේ අන්තර්ගත විය යුතු මූලික අංග **හතරක්** නම් කරන්න.

(ii) ඉහත ලිපිය පරිගණකය ආධාරයෙන් සකස්කර ගැනීම සඳහා භාවිත කළ හැකි පරිගණක මෘදුකාංග **දෙකක්** නම් කරන්න.

(iii) ඉහත ලිපිය විද්‍යුත් තැපෑල භාවිත කරමින් මාධ්‍ය ආයතනය වෙත යොමු කළේ නම් එහි වාසි **දෙකක්** සඳහන් කරන්න.

(iv) රටක සිටින සියලු මාධ්‍යවේදීන් හෝ මාධ්‍යකරුවන් වර්ග කළ හැකි කොටස් **දෙක** නම් කරන්න.

(v) ගුවන්විදුලි ආයතනයක ප්‍රධාන අංශ **දෙකක්** ලියා දක්වන්න.

(vi) පුවත්පත් ආයතනයක ප්‍රධාන කර්තෘවරයා සතු කාර්යයන් **දෙකක්** සඳහන් කරන්න.

(vii) රූපවාහිනී මාධ්‍යයේ විශේෂතා **දෙකක්** නම් කරන්න.

(viii) ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය හිමිකම බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න.

(ix) ජන මාධ්‍ය ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවියක ඇති වාසි **දෙකක්** සඳහන් කරන්න.

(x) ඉහත ක්ෂේත්‍ර චාරිකාව අවසානයේ දී සමාලෝචනය සඳහා භාවිත කළ හැකි ප්‍රක්ෂේපණීය උපකරණ **දෙකක්** නම් කරන්න.

2. පාසල් මාධ්‍ය සමාජය මගින් සංවිධානය කරනු ලැබූ මාධ්‍ය දින උළෙලේ දී නිර්වාචික සන්නිවේදන විධික්‍රමයක් ලෙස ඉදිරිපත් කළ අභිරූපණ රංගනය ඉතා විචිත්‍රවත් හා ආකර්ෂණීය අංගයක් විය.

(i) නිර්වාචික සන්නිවේදනය යන්න හඳුන්වන්න.
(ii) නිර්වාචික සන්නිවේදනයට අයත් විධික්‍රම **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.
(iii) සාම්ප්‍රදායික සමාජය තුළ සන්නිවේදනය සඳහා භාවිත කරන ලද නිර්වාචික සන්නිවේදන ක්‍රම **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
(iv) උළෙලට සමගාමීව පැවති කෙටි චිත්‍රපට තරගාවලියේ අවසාන වටයට නිර්දේශ වූ චිත්‍රපට උත්සව සභාවට ප්‍රදර්ශනය කිරීම සඳහා යොදාගත හැකි ප්‍රක්ෂේපණීය සන්නිවේදන උපකරණ **දෙකක්** නම් කර ඉන් **එකක** වාසි දෙකක් විස්තර කරන්න.

3. " හැම උද්වේගකර ආරංචියක් ම ප්‍රවෘත්තියකි. "

(i) ඉහත ප්‍රකාශය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ii) ප්‍රවෘත්තියක අන්තර්ගතය හා ස්වභාවය අනුව වර්ග කළ හැකි ප්‍රධාන ප්‍රභේද **දෙක** පැහැදිලි කරන්න.
(iii) ප්‍රවෘත්තියක වටිනාකම කෙරෙහි බලපාන සාධක **තුනක්** විස්තර කරන්න.
(iv) ප්‍රවෘත්ති වාර්තාකරණය සඳහා යොදා ගන්නා යටිකුරු පිරමීඩ ආකෘතිය ඇඳ නම් කර, ඒ අනුව තොරතුරු ගොනු කරන අයුරු පැහැදිලි කරන්න.

4. පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී දෘශ්‍ය ක්‍රමවේද භාවිතය සිසු ආකර්ෂණයට හා ඵලදායී ඉගෙනුම් ක්‍රියාවලියකට දායක වෙයි.

(i) දෘශ්‍ය සන්නිවේදනය සඳහා සාම්ප්‍රදායිකව භාවිත වූ ක්‍රමවේද **දෙකක්** නම් කරන්න.
(ii) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ අවශ්‍යතාව/ වාසි **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) රූපවාහිනී වැඩසටහන් ප්‍රභේද **තුනක්** පැහැදිලි කරන්න.
(iv) දෘශ්‍ය සන්නිවේදනය සඳහා භාවිත කළ හැකි නව මාධ්‍ය විධික්‍රම **හතරක්** පැහැදිලි කරන්න.

5. "මාධ්‍ය සන්දේශ නිවැරදිව තේරුම් ගැනීම සඳහා විචාරශීලී ග්‍රාහකයෙක් වීම අත්‍යවශ්‍ය වේ."

(i) ග්‍රාහකයන් මාධ්‍ය සන්දේශ සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය අනුව බෙදිය හැකි ප්‍රධාන කාණ්ඩ **දෙක** නම් කරන්න.
(ii) විචාරශීලී ග්‍රාහකයෙකු සතු නිපුණතා **දෙකක්** කෙටියෙන් විස්කර කරන්න.
(iii) නව මාධ්‍ය යන්න හඳුන්වා නව මාධ්‍යයේ ස්වභාවය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න.
(iv) ජන මාධ්‍ය ග්‍රාහක ප්‍රතිචාර ලබා ගන්නා ක්‍රමවේද **හතරක්** විස්තර කරන්න.

6. "දෘශ්‍ය මාධ්‍යයක් ලෙස ඉහළ ප්‍රකාශන හැකියාවක් ඡායාරූපය සතු වේ. ස්වභාව සෞන්දර්යය විචිත්‍රවත් ආකාරයෙන් කැමරා ඇසට හසුකර ගැනීමට නිර්මාණාත්මක ඡායාරූපකරණ පිළිබඳ කුසලතාවක් පැවතිය යුතු ය. "

(i) කලින් සැලසුම් කොට රූපගත කරන ඡායාරූපවලට නිදසුන් **දෙකක්** සපයන්න.

(ii) වෘත්තීය ඡායාරූප ශිල්පියෙකු සතුවිය යුතු ලක්ෂණ **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) ඡායාරූපකරණයේ දී සිදු නොකළ යුතු ආචාරධර්මවලට පටහැනි ක්‍රියාවන් **තුනක්** විස්තර කරන්න.

(iv) ඔබ පාසලේ නිශ්චල ඡායාරූප ශිල්පය පුහුණු කිරීමේ අරමුණින් පුහුණු කඳවුරක් පැවැත්වීමට තීරණය කර ඇත. එහි දී සිදුකළ හැකි ක්‍රියාකාරකම් **හතරක්** විස්තර කරන්න.

7. මුද්‍රිත මාධ්‍යයන්ගේ අන්තර්ගත සුවිශේෂී ගුණාංග හේතුවෙන් එය අත්‍යවශ්‍ය මාධ්‍යයක් බවට පත්ව ඇත.

(i) මුද්‍රිත මාධ්‍ය ස්වරූප **දෙකක්** නම් කරන්න.

(ii) පාඨකයාට කාලීන වූ, සමීප හා අදාළ වූ උණුසුම් තොරතුරු ලබා දීමට යොදා ගන්නා පුවත්පතක අන්තර්ගත ආකෘති **දෙකක්** නම් කර ඒවාට නිදසුන් සපයන්න.

(iii) මහජනතාව වෙත සෘජුවම තොරතුරු දැනුම්දීම සඳහා අත් පත්‍රිකා යොදාගන්නා අවස්ථා **තුනක්** විස්තර කරන්න.

(iv) පුවත්පතේ ප්‍රමාණය අනුව ප්‍රධාන වර්ගීකරණ **දෙක** දක්වා නිදසුන් සහිතව විස්තර කරන්න.

*****

# පත්‍රය I - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 11 | 2 | 21 | 1 | 31 | 2 |
| 02 | 3 | 12 | 2 | 22 | 3 | 32 | 4 |
| 03 | 4 | 13 | 3 | 23 | 2 | 33 | 4 |
| 04 | 1 | 14 | 4 | 24 | 2 | 34 | 3 |
| 05 | 4 | 15 | 4 | 25 | 1 | 35 | 2 |
| 06 | 2 | 16 | 2 | 26 | 3 | 36 | 3 |
| 07 | 4 | 17 | 3 | 27 | 2 | 37 | 3 |
| 08 | 1 | 18 | 1 | 28 | 4 | 38 | 4 |
| 09 | 2 | 19 | 3 | 29 | 3 | 39 | 1 |
| 10 | 4 | 20 | 1 | 30 | 1 | 40 | 3 |

විශේෂ උපදෙස් - එක් පිළිතුරකට ලකුණු 01 බැගින්

මුළු ලකුණු 1 X 40 = 40

*****

# පත්‍රය II - පිළිතුරු

| | | |
|---|---|---|
| 1 වන අනිවාර්ය ප්‍රශ්නයට ලකුණු 02 බැගින් 10 | - | 20 |
| 2 වන - 7 වන ප්‍රශ්න සඳහා තෝරාගත් ප්‍රශ්න 04කට ලකුණු 10 බැගින් | - | 40 |
| | | 60 |

## කොටස් ලකුණු බෙදීම

2 - 7 දක්වා සෑම ප්‍රශ්නයක් සඳහා

| | | | |
|---|---|---|---|
| I. | කොටසට | - | ලකුණු 1 |
| II. | කොටසට | - | ලකුණු 2 |
| III. | කොටසට | - | ලකුණු 3 |
| IV. | කොටසට | - | ලකුණු 4 |
| | | | 10 |

01.

(i) යවන්නාගේ නම
ලිපිනය
දිනය
ලිපියේ මාතෘකාව
අන්තර්ගතය
අවසානය

(ii) Ms Word, Page maker, Corel Draw, In design

(iii) කාර්යක්ෂමතාවය
විශාල පිරිසක් වෙත එකවර යැවීමේ හැකියාව
විද්‍යුත් තැපැල් ගොනුවේ සටහන්වී ඇති හෙයින් කියවා ගැනීමට හා අවශ්‍ය අවස්ථාවල පරිහරණය පහසු වීම
පිරිවැය අවම වීම
බාහිර පාර්ශ්වයන්ගෙන් ලැබෙන ලිපි සඳහා ඉක්මණින් පිළිතුරු යැවීමට හැකිවීම
නිල වශයෙන් ආයතනයක් වෙත යැවිය හැකිවීම

(iv) ආයතනයට සම්බන්ධ මාධ්‍යවේදීන්
නිදහස් මාධ්‍යවේදීන්

(v) ප්‍රවෘත්ති අංශය
වැඩසටහන් අංශය
තාක්ෂණික අංශය
දැන්වීම් අංශය

(vi) පුවත්පතේ අන්තර්ගතය හා ව්‍යුහය පිළිබඳව සමස්ත වගකීම දැරීම
සංස්කාරක වැකිය හෙවත් කතු වැකිය ලිවීම
පුවත්පත සංස්කරණයේ සමස්ත වගකීම
නඩු කටයුතුවල දී නෛතික වගකීම

(vii) ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍යයකි
සමීප මාධ්‍යයකි
සජීවී මාධ්‍යයකි
ජන මාධ්‍යයකි
අස්ථායී මාධ්‍යයකි
වියදම් අධික මාධ්‍යයකි

(viii) රාජ්‍ය හා පෞද්ගලික

(ix) ආයතනයේ තොරතුරු වහාම ලෝකය පුරා ඕනෑම කෙනෙකුට ග්‍රහණය කරගැනීමට හැකිවීම
ආයතනයේ තොරතුරු යාවත්කාලීන කිරීම
ආයතනයේ කාර්යයන් සමාජයට විවෘත කිරීම
ආයතනයේ කටයුතු වඩා විධිමත්ව පිළිවෙලට කළ හැකිවීම
ආයතනයේ තොරතුරු වේගවත්ව නිකුත් කළ හැකි වීම
වෙබ් අඩවිය ඔස්සේ විවිධ ප්‍රතිචාර වහා ලබාගත හැකිවීම

(x) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය (OHP)
කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය (Slide Projector)
ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය
බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය
අන්තර් ක්‍රියාකාරී පුවරුව

02.

(i) නිර්වාචික සන්නිවේදනය යනු, වචන භාවිතයෙන් තොරව සිදු කරනු ලබන සන්නිවේදනය යි. එනම් වාචික සන්නිවේදනය වඩාත් ශක්තිමත්ව සිදු කිරීමට අවාචික සන්නිවේදන විධික්‍රම භාවිත කරනු ලබයි.

(ii) ශාරීරික ඉඟි හා ඉරියව්
මුහුණේ ඉඟි හා ඉරියව්
ඇස්වල හැසිරීම
හඬ, උච්චාරණය හා නිහඬ බව
ඇඳුම් හා පැළඳුම්

(iii) බෙර හඬ
හූ හඬ
බුලත් දීමේ චාරිත්‍රය
ගිනි මැල
පූජා ක්‍රම
ජන නැටුම්

(iv) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය
අන්තර් ක්‍රියාකාරී පුවරුව
ලේඛන, හඬ, චලන රූප, වීඩියෝ, සිනමා, සජීවීකරණ දර්ශන ආදිය නැරඹිය හැකි වීම
ආකර්ශනීය මෙන්ම ප්‍රතිඵලදායී වීම
පන්ති කාමරයේ ඇති විශාල තිරයකට ප්‍රක්ෂේපණය කළ හැකි වීම
දුරස්ථ පාලකයක් මඟින් ක්‍රියාත්මක කළ හැකිවීම
ඇඟිල්ලෙන් ස්පර්ශ කිරීමෙන් වැඩසටහන ක්‍රියාත්මක කළ හැකි වීම

3.

(i) මිල්ටන් බුෂ්

(ii) දෘඪ පුවත් - විහාල පිරිසකට බලපෑමක් ඇති කළ හැකි, ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමේ වැදගත්කමකින් යුත්, කාලීන වටිනාකමක් සහිත පුවත් වේ.
මෘදු පුවත් - සමාජයට වැඩි බලපෑමක් ඇති නොකරන එහෙත් වැඩි දෙනාගේ අවධානය හා කැමැත්ත දිනා ගන්නා, මානව හැඟීම්වලට ආමන්ත්‍රණය කරන පුවත් වේ.

(iii) කාලීන බව
සමීප බව
අදාළ බව
කැපීපෙනීම
ගැටුම්
මානව ළැදියාව
බලපෑම හා වැදගත්කම
අසාමාන්‍ය බව

(iv)




4.

(i) ගින්දර, දුම, ගස්වල කොළ අතු එල්ලීම, චිත්‍ර, ගස්වල කැපූ කට්ටා, අංගරචන, අභිනය

(ii) අඩු පිරිවැය
ආකර්ෂණීය නිමාව
ඉක්මන් බව
පහසුව
කාර්යක්ෂමතාව

(iii) ප්‍රවෘත්ති
වාර්තා වැඩසටහන්
ටෙලි නාට්‍ය
සංගීත වැඩසටහන්
සාකච්ඡා හා සංවාද
සඟරාමය වැඩසටහන්
යථාකාරී වැඩසටහන්
සජීවී විකාශ

(iv) Face book, WhatsApp, Viber, Instagram, Telegramme, Imo

**5.**

(i) සක්‍රීය ග්‍රාහකයා
නිෂ්ක්‍රීය ග්‍රාහකයා

(ii) ජන මාධ්‍ය මගින් ඉදිරිපත් කරන දේ නිසි ලෙස අවබෝධ කර ගැනීමේ හැකියාව
මාධ්‍ය මගින් සඟවන දේ කුමක්දැයි අවබෝධ කර ගැනීමේ හැකියාව
ජන මාධ්‍ය කටයුතු කරන්නේ කුමන අරමුණකින් ද යන්න තේරුම් ගැනීමේ හැකියාව
ජන මාධ්‍ය උත්සාහ දරන්නේ තමා කෙබඳු පුද්ගලයකු බවට පත් කිරීමට ද යන්න අවබෝධ කර ගැනීමේ හැකියාව
ග්‍රාහකයා පොළඹවා ගැනීමට මාධ්‍ය විසින් ගන්නා උපාය මාර්ග තේරුම් ගැනීමට ඇති හැකියාව
මාධ්‍ය කුමක් ඉදිරිපත් කළ ද තමාට අවශ්‍ය දේ පමණක් තෝරා බේරා ගෙන පරිහරණය කිරීමට ඇති හැකියාව
මාධ්‍ය වෙත මාධ්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ තමාගේ ප්‍රතිචාර පෞද්ගලිකව හා සංවිධානාත්මකව ඉදිරිපත් කිරීම මඟින් මාධ්‍ය සමඟ අන්තර් සබඳතාවක් පවත්වා ගැනීමට ඇති හැකියාව

(iii) මෑත යුගයේ බිහිවූ පෙරළිකාර තාක්ෂණය වන අංකිත තාක්ෂණය පදනම් කරගෙන බිහිවූ මාධ්‍ය නව මාධ්‍ය වේ.

භූගෝලීය වශයෙන් සීමා නොවීම

ග්‍රාහකයාට අභිමත පරිදි සන්දේශ තෝරා ගැනීමට හැකි වීම

පරිගණකය, ජංගම දූරකථනය වැනි බහුමාධ්‍ය උපකරණ ආශ්‍රිතව භාවිත කිරීමට හැකි වීම

ඕනෑම අවස්ථාවක, ඕනෑම ස්ථානයක සිට භාවිත කළ හැකි වීම

ගෝලීය වශයෙන් ව්‍යාප්තිය සිදු වීම

සම්බන්ධ වන සියලු දෙනාට ම අන්තර් ක්‍රියාකාරී ලෙස තොරතුරු හුවමාරු කර ගැනීමට හා සංස්කරණය කිරීමට ඇති හැකියාව

(iv) තැපැල්පත්

දූරකථන ඇමතුම්

විද්‍යුත් තැපැල

කෙටි පණිවිඩ

සමාජ ජාල වෙබ් අඩවි

පුවත්පත්වලට ලිපි සම්පාදනය

ලිපියක් ලෙස සකසා ප්‍රතිචාර දන්වා යැවීම

මාධ්‍ය පා ගමනක් හෝ උද්ඝෝෂණයක් සංවිධානය කිරීම

6.

(i) වෙළෙඳ දැන්වීම් සඳහා අවශ්‍ය කරන ඡායාරූප

සඟරා හා පොත් පිටකවර සඳහා අවශ්‍ය කරන ඡායාරූප

පුරා විද්‍යාත්මක ඡායාරූප

ගුවන් ඡායාරූප

(ii) ඡායාරූපකරණය පිළිබඳ ප්‍රමාණවත් දැනුම
නිර්මාණශීලී වීම
නව තාක්ෂණය හා අත්වැල් බැඳ ගැනීම
කලට වේලාවට වැඩ කිරීම
ඡායාරූපශිල්පය පිළිබඳ නෛතික හා සදාචාරාමක සීමාවන් පිළිබඳ වැටහීම
ආචාරශීලී පුද්ගලයෙක් වීම
සේවාදායක අපේක්ෂා හා ප්‍රතිචාර වෙත නම්‍යශීලී වීම
මනා කළමනාකරණයකින් යුතු වීම

(iii) වෙනත් ඡායාරූප ශිල්පියකුගේ නිර්මාණයක් නිර්මාණකරුගේ අවසරයකින් තොර ව තම අවශ්‍යතා සඳහා භාවිත කිරීම නොකළ යුතු ය.
අවසරයකින් තොරව වෙනත් අයකු ඡායාරූපයට නැගීම හෝ එවැනි ඡායාරූප ළඟ තබා ගැනීම නොකළ යුතු ය.
වෙනත් අයෙකු පෙනී සිටින ඡායාරූපයක් එම පුද්ගලයා නොදැනුවත් ව අන්තර්ජාලයේ හෝ වෙනත් ප්‍රසිද්ධ මාධ්‍යවල පළ කිරීම හෝ එකිනෙකා අතර හුවමාරු කර ගැනීම නොකළ යුතු ය.
වෙනත් අයකු පෙනී සිටින ඡායාරූපයක් තාක්ෂණය යොදා ගෙන විකෘති කිරීම නොකළ යුතු ය.
ඡායාරූප යොදා ගෙන තවත් අයෙක් අපහසුතාවට හෝ හිංසාවට පත් කිරීම නොකළ යුතු ය.

තවත් අයකුගේ කටයුතුවලට බාධා වන අයුරින් ඡායාරූප ගැනීම නොකළ යුතුය.

(iv) පාරිසරික වශයෙන් වැදගත් ස්ථාන ඡායාරූපයට ගැනීමට අවස්ථා සැළසීම
නිශ්චල ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වීම
සම්පත් පුද්ගල දායකත්වය ලබා ගනිමින් ඡායාරූපකරණය පිළිබඳ ශිල්පීය නිපුණතා ලබා දීම
කැමරාවක් ක්‍රියාත්මක කිරීමේ තාක්ෂණික පුහුණුව ලබා දීමට සැළසුම් කිරීම

7.

(i) පොත්
පුවත්පත්
සඟරා
පෝස්ටර්
අත් පත්‍රිකා

(ii) ප්‍රවෘත්ති
කතු වැකිය
විශේෂාංග
තීරු ලිපි
කාටූන්
ඡායාරූප

(iii) වෙන්දේසියක්, රැස්වීමක්, උත්සවයක්, විවෘත කිරීමක් පිළිබඳ දැනුම් දීම
නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීම
සෞඛ්‍ය පිළිබඳ දැනුම්වත් කිරීම්
භාණ්ඩ හා සේවා අලෙවි ප්‍රවර්ධනය

(iv) බ්‍රෝඩ් ෂීට් පුවත්පත් - පළල් පිටු සහිත පුවත්පත් මේ නමින් හඳුන්වයි.
දිනපතා, සතිපතා පළවන සිංහල, ඉංග්‍රීසි හා දෙමළ ජාතික පුවත්පත්
ටැබ්ලොයිඩ් පුවත්පත් - බ්‍රෝඩ්ෂීට් පුවත්පතක පිටුවකින් හරි අඩක විශාලත්වයෙන් යුත් පුවත්පත් ටැබ්ලොයිඩ් පුවත්පත් ලෙස හඳුන්වයි.
කාන්තා, ළමා, යොවුන් පුවත්පත්

*****